ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) ව්‍යාපාතියේ ඒඩ්ස් 09 වන වටය සංරචකය - 2012

---

1. **<u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනියන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මාගේ මතය වනුයේ ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයන ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඇ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

2.1 **<u>මූල්‍ය කාර්යසාධනය</u>**

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.110,519,936 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.264,207,735 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම , ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 31,388,458 | 4,904,438 | 51,888,440 |
| එච්අයිවී ඒඩ්ස් පාලන කාර්යයන් | 79,131,478 | 47,129,044 | 212,319,295 |
| | 110,519,936 | 52,033,482 | 264,207,735 |

**2.2** <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

(i) 2011 වර්ෂයට අදාල අනුරූප සංඛ්‍යා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ii) 2011 සහ 2012 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තත්ත්වය පහත සඳහන් පරිදිවේ.

| | **2012.12.31** | **2011.12.31** |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වලන් වූ මුදල් ප්‍රවාහය** | | |
| විදේශ ආධාර ප්‍රදාන වලින් ලැබුණු මුදල් (වැය -13) | 117,000,000 | 44,127,850 |
| දේශිය අරමුදලින් විදේශාධාරවලට අදාළව(වැය17 ) ලැබුණු මුදල් | 10,000,000 | 872,150 |
| ටෙන්ඩර් වලින් ලැබුණු මුදල් | 55,500 | 86,000 |
| වැඩ සටහන් වියදම සඳහා ගෙවන ලද මුදල් | (79,131,477) | (47,129,044) |
| දෙන ලද අත්තිකාරම් (ශුද්ධ) | (6,860,451) | (10,121,541) |
| ගෙවිය යුතු මුදල් අඩුවීම් (රඳවා ගැනීමේ බද්ද සහ රඳවා ගැනීම් මුදල් ) | - | (247,327) |
| | ------------- | --------------- |
| මෙහෙයුම් කටයුතු වලන් ශුද්ධ මුදල් ප්‍රවාහය | 41,063,572 | 7,831,170 |
| | ========= | ======== |
| **ආයෝජන කටයුතු වලන් මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් | <u>(31,388,458)</u> | <u>(4,904,438)</u> |
| ආයෝජන කටයුතු වල යෙදූ ශුද්ධ මුදල් | (31,388,458) | (4,904,438) |
| **මූල්‍ය කටයුතු වලන් මුදල් ප්‍රවාහය** | | |
| රේඛිය අමාත්‍යාංශයට (භාණ්ඩාගාරය) මුදල් ආපසු යැවීම | <u>(9,675,114)</u> | <u>(2,926,732)</u> |
| ශුද්ධ මුදල් වැඩිවීම | නැත | නැත |
| | ========== | ========= |

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාස | |
| (i) අංක 371(2)(ඇ) | අත්තිකාරම් මුදල් දෙන ලද කාර්ය නිම කල වහාම පියවිය යුතු වුවත් අවස්ථා 28 ක දි එකතුව රු.13,847,323 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරම සඳහා මාස 2 සිට මාස 10 ක කාලයක් ප්‍රමාදයන් තිබ බව නිරීක්ෂණය විය. |
| (ii) අංක 756 | රු. 51,888,440 වටිනාකම වූ ස්ථාවර වත්කම් වලට අදාලව සමාලෝචිත වර්ෂය සඳහා භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. |
| (ආ) 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්/ඊආර්ඩී/2007/02 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ මාර්තු 31 හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2013 ජුනි 25 දිනදීය. |

### 3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

රු.15,191,113 ක් වටිනා රසායනාගාර උපකරණ මිලදී ගැනිම සම්බන්ධයෙන් රෝහල විසින් රසායනාගාර උපකරණ අවශ්‍ය බවට කරන ලද විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 03 දින රු. 6,080,000 කට මිලදී ගන්නා ලද X - කිරණ යන්ත්‍ර මාස එක හමාරක කාල පරිච්ඡේදයකට පසු අදාල රෝහල වෙත ලබා දී තිබුණි.වසර එක හමාරක කාලයක් ගත වී ඇතත් 2013 අගෝස්තු 31 දින වන විටත් එකී යන්ත්‍ර අදාළ රෝහල් විසින් භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) ඒක නාලික පිපෙට්ටු (Single Channel Pipettes) 32 ක් මිලදී ගැනිම සඳහා රු.460,160 කට ඇනවුම පිරිනැමිය යුතු වුවත් රු.508,800 කට ඇණවුම පිරිනැමීම නිසා රු.48,640 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) රු.2,227,456 ක වටිනාකමින් යුත් $CD_4$ Count Reagent Kits මිලදී ගැනිම සඳහා ඇනවුම් කර තිබුණු නමුත් එම උපකරණ ලැබිම සඳහා මාස 06 සිට වර්ෂයක කාලයක් ගත වී තිබුණ බව නිරීක්ෂණය විය.

(ඈ) (i) නිසි ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමෙන් තොරව අවස්ථා 7 ක දී රු.923,325 ක අත්තිකාරම් ගෙවා තිබුණ අතර ඉන් පියවා තිබුණේ රු.376,163 ක් හෙවත් සියයට 40 ක ප්‍රමාණයක් පමණි.

(ii) ලබා ගන්නා ලද රු.554,176 ක් වු අත්තිකාරම් මුදල් අදාළ කාර්ය සඳහා උපයෝගි කර ගැනිමකින් තොරව මාස 04 සිට 06 කාලයකට පසුව පියවා තිබුණි.

(ඉ) (i) පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණු නමුත් 2010 ජුනි 15 දින වන විට ගිවිසුම් දිනය අවසන් වී තිබුණි. එම ආයතනයට ලබා දෙන ලද රු.88,146 ක අත්තිකාරම් මුදල 2013 ඔක්තෝබර් මස දක්වාත් පියවා නොතිබුණි.

(ii) එකි ආයතනයෙන් මිලදී ගන්නා ලද වත්කම් ගිවිසුම් කාලපරිච්ජේදය අවසානයේදි අමාත්‍යාංශයට භාරදිය යුතු වුවත් රු.1,566,077 ක් වටිනා ගෘහභාණ්ඩ සහ පරිගණක 2013 ඔක්තෝබර් 31 දින වන විටත් භාර දි නොතිබුණි.

(ඊ) රු.9,675,114 ක් මුදලක් ව්‍යාපෘති කාර්යයන් සඳහා වැය කිරීමෙන් තොරව වර්ෂය අවසානයේදි මුදල් අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

3.4 <u>ආර්ථික නොවු ගණුදෙනු</u>

රු.99,000 ක වටිනාකමකින් යුත් MB/Bact/MP/100/FLAcons බෝතල් සියයක් 2012 වර්ෂයේදි මිලදී ගෙන තිබුණි. මෙම බෝතල් අංගොඩ මුලික රෝහලට අනවශ්‍ය බව සඳහන්ව තබුණද ඒවා ආපසු භාර දි නොතිබුණු අතර 2013 ජනවාරි 29 වන විට මෙම බෝතල්වල කාලය , ඉකුත් වී තිබුණි.

## 4. <u>මුල්‍ය හා භෞතක කාර්ය සාධනය</u>

### 4.1. <u>අරමුදල් උපයෝජනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී කාර්යයන් 08 ක් සඳහා වෙන්කර තිබණු එකතුව රු.3,950,166 ක් වු මුළු අයවැයගත වෙන්කිරීම් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) අදාළ බලධාරින්ගේ නිසි අනුමැතියක් ලබාගැනිමෙන් තොරව කාර්යන් 12 ක් සඳහා අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.28,983,685 ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) ව්‍යාපෘති ක්‍රියාකාරකම් 33 ක සඳහා රු.89,915,206 ක අයවැය මගින් වෙන්කරනු ලැබ තිබුණද 2012 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණේ මුළු ප්‍රතිපාදනයෙන් රු.26,908,815 හෙවත් සියයට 29 ක ප්‍රමාණයක.

(ඈ) වාර්ෂික අයවැයේ ප්‍රතිපාදන වෙන්කිරිමකින් තොරව කාර්යයන් 10 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදි රු.12,022,961 ක් වැය කර තිබුණි.තවද මෙම අරමුදල් උපයෝගි කර ගැනිම සඳහා ලබාගන්නා ලද නිසි අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ලෝක " ඒඩ්ස් " දිනය සඳහා වාර්ෂික අයවැය මගින් රු.4,604,790 ක මුදලක් වෙන්කර තිබුණද ඒ සඳහා තත්‍ය වශයෙන් දරන ලද වියදම රු.760,189 ක් පමණි.

5. <u>අභ්‍යන්තර විගණනය</u>

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

6. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) භාණ්ඩ ප්‍රසම්පාදනය
(ආ) තොග
(ඇ) අරමුදල් උපයෝජනය
(ඈ) අග්‍රිම හා අත්තිකාරම් නිරවුල් කිරීම
(ඉ) ගිණුම්කරණය